ISSN: 2012-7235

# [02]
# අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

චානක පියසේන

## 1. හැඳින්වීම

මිනිසා යනු සමාජයීය සත්වයෙකි. මිනිසෙකු මෙලොව එළිය දකීමටත් පෙර, එනම් යුක්තානුවක් ලෙස සංසේචනය වූ මෙහොතේ පටන්ම මව සමඟ සම්බන්ධතා පවත්වයි[1]. එතැන් සිට මිනිසාගේ මරණයෙන් පසු අවමඟුල් කටයුතු දක්වාම මිනිසා විවිධ පරාසයන්ගෙන් විවිධ මිනිසුන් සමඟ සම්බන්ධතා පැවැත්වීම පොදු ගති ලක්ෂණයකි. මිනිසාගේ මෙම ගති ලක්ෂණය නිසාම සමාජය නිර්මාණය වී ඇත. සමාජය යන්නට ඉංග්‍රීසි වචනය Society වේ. මෙය ලතින් සොසියුස් (Socius) යන වචනයෙන් සැකසී ඇත. සොසියුස් යන ලතින් වචනයේ අර්ථය මිත්‍රත්වය යන්නයි. ඒ අනුව සමාජය යන පදයේ අදහස සාමුහික සමාජ සම්බන්ධතා වලින් ජීවත් වීම යන්නයි[2]. මේ අනුව පුද්ගල සම්බන්ධතා යනු වඩාත් වැදගත් මෙන්ම ප්‍රයෝගික වූ මානව සමාජයීය සංකල්පයකි. නූතන කළමනාකරණ පරිචය තුළ මිනිසා පොදු අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටුකර ගැනීම උදෙසා තවත් පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් සමඟ සාමුහිකව කටයුතු කිරීම සංවිධාන ලෙස හඳුනාගනු ලැබේ[3,4]. නූතන සමාජය, ආර්ථිකය, දේශපාලන වැනි සියළු අංශ දෙස අවධානය යොමු කිරීමේ දී එම අංශ සියල්ලම සංවිධාන මත පදනම්ව නිර්මාණය වූ අංශ බව පැහැදිළි ය. ඕනෑම සාර්ථක සංවිධානයක දකිය හැකි අනිවාර්ය සාධක තුනකි. ඒවා නම් පුද්ගලයන් සිටීම, පොදු අරමුණක් හෝ අරමුණු කිහිපයක් පැවතීම සහ පුද්ගලයන් අතර මනා සාමුහික ක්‍රියාකාරිත්වය වේ[5]. ඒ අනුව ඕනෑම සංවිධානයක සාර්ථකත්වය පිණිස මිනිසුන් අතර සාමුහික ක්‍රියාකාරිත්වය අත්‍යාවශ්‍යම සාධකයක් ලෙසට පෙන්වා දිය හැකිය. කණ්ඩායමක සාර්ථකත්වය සහ සාර්ථකත්වයේ වර්ධනය සඳහා සාමුහික ක්‍රියාකාරිත්වය හෙවත් අන්තර්පුද්ගල සම්බන්ධතාවය ඉතාම වැදගත් වේ. එම නිසා අතීතයේ මෙන්ම වර්තමාන සංවිධාන කළමනාකරණ පරිචය තුළ දී ද අන්තර් පුද්ගල සම්බන්ධතා සඳහා දක්වන වැදගත්කම ඉතා ඉහළ මට්ටමක පවතී. වර්තමාන සංවිධාන කළමනාකරුවන් විසින් අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් පිළිබඳවමෙතරම් වැදගත්කමක් දැක්වීමට නැඹුරු වී ඇති බව අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කම පිළිබඳව ඉදිරිපත් වී ඇති බටහිර කළමනාකරණ මතවාදයන් බහුල වීමෙන් තහවුරු වේ. සංවිධාන සාර්ථකත්වයට අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කම පිළිබඳව ඉදිරිපත් වී ඇති බටහිර කළමනාකරණ මතවාදයන්ට සාපේක්ෂව සමස්ත සමාජ සංවර්ධනයට අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කමපිළිබඳව ඉදිරිපත් වී ඇති බෞද්ධ ඉගැන්වීම් වෙත අවධානය යොමු කිරීම මෙම ලිපිය මගින් අපේක්ෂා කරනු ලැබේ.

## 2. අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදගත්කම පිළිබඳව ඉදිරිපත් වී ඇති බටහිර කළමනාකරණ මතවාදයන්

ඉදිරි අරමුණු හෝ හැඟීම් මත පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිපදෙනෙකු අතර ඇති කර ගන්නා බැඳීම අන්තර් පුද්ගල සම්බන්ධතාවයක් ලෙස හැඳින්විය හැකිය (A strong bond between two or more people refers to interpersonal relationship)[6]. පුද්ගලයන් අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම තුළින් ආර්ථික වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන් ද අතිශය වැදගත්කමක් පවතින බව තහවුරු කරවන බටහිර සොයා ගැනීම් විශාල වශයෙන් පවතී. රොබට් එල්. කාට්ස් දක්වන අන්දමට කළමනාකරුවකු වෙත පැවරී ඇති ඕනෑම කාර්යයක් සාර්ථකව ඉටු කිරීම සඳහා ඔනෑම කළමනාකරුවකු වෙත තාක්ෂණික කුසලතාවය සහ සංකල්පනාත්මක කුසලතාවය අඩු වැඩි වශයෙන් වැදගත් වේ. නමුත් ඉහළ, මධ්‍යම සහ

ISSN: 2012-7235

පහළ යන ඹනෑම මට්ටමක කළමනාකරුවකු වෙත මානව සම්බන්ධතා කුසලතාව එක සමාන වැදගත්කමක් පවතී[7,8]. අනෙකුත් පුද්ගලයන් අවබෝධ කර ගැනීමට, ඹවුන් සමඟ කටයුතු කිරීමට සහ ඹවුන් ලවා වැඩ කරවා ගැනීමට කළමනාකරුවකු සතුව පවතින හැකියාව මානව සම්බන්ධතා කුසලතාව යන්නට ඇතුළත් වේ[8]. මේ යටතේ කණ්ඩායමකට නායකත්වය දීමට ඇති හැකියාව, සන්නිවේදන හැකියාව, පුද්ගලයන් අභිප්‍රේරණය කිරීමට ඇති හැකියාව සහ කණ්ඩායම් ලෙස කටයුතු කිරීමට ඇති හැකියාව වැනි හැකියාවන් ඇතුළත් ය. ධනාත්මක අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීමේ සහ දිගින් දිගටම පවත්වාගෙන යාමේ කුසලතාව ඇතුළත්ය[9]. Champbell[10] දක්වන පරිදි බොහෝ ඇමරිකානු වාර්තාවලට අනුව පුද්ගලයන් පවත්වන අන්තර් පුද්ගල සම්බන්ධතාවන්හි ප්‍රමාණය සහ ඒවායේ ගුණාත්මක භාවය අනුව පුද්ගලයාගේ ජීවිතවල ගුණාත්මක භාවය තීරණය වේ. එසේම අන්තර් පුද්ගල සම්බන්ධතා බිඳවැටීම සහ සියදිවි නසා ගැනීම අතර සම්බන්ධයක් පවතින බව සොයාගෙන ඇත[11]. අනෙක් අතට අන්තර් පුද්ගල සම්බන්ධතාවල ගැටළු සහිත වීම මත පුද්ගලයන්ට මානසික ගැටළු ඇති වන බවද සොයාගෙන ඇති කරුණකි[12]. Alexandrer[13] සහ Murstein[14] දක්වන පරිදි අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි සඵලදායී සන්නිවේදනය ඉතාම වැදගත් කරුණකි. සන්නිවේදනය තුළින් අනෙකුත් පුද්ගලයන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමේ හැකියාව පවතී. කණ්ඩායමක් තුළ වැඩකටයුතු කිරීමේ දී ඒ සඳහා ධනාත්මක වාතාවරනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ඵලදායී සන්නිවේදනය, ගැටුම් කළමනාකරණය සහ ගිවිසගැනීම යන කුසලතාවන් වැදගත් කරුණුය[15]. Quinn සහ Hughes[16] හඳුනාගන්නා පරිදි ඵලදායී කණ්ඩායමක් තුළ කණ්ඩායම පොදු අරමුණක් වෙත යොමු වීම, කණ්ඩායමේ සාමාජිකයන්ට අන්තර් රූඪියාවකින් යුක්ත කාර්යන් සහ වගකීම් පැවරී තිබීම, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා උපකාරී වන සන්නිවේදන ව්‍යුහයක් පැවතීම සහ කණ්ඩායමේ පොදු වගකීම පිළිබඳ හැඟීමක් පැවතීම යන සාධක අත්‍යවශ්‍යයෙන්ම පැවතිය යුතු සාධක ලෙස හඳුනාගනී. Adair[17] විසින් දක්වන පරිදි කාර්ය සම්පූර්ණ කිරීම, කණ්ඩායම පවත්වාගෙන යාම සහ පෞද්ගලික සංවර්ධනය ඇතිකර ගැනීම යන ලක්ෂණ කණ්ඩායම් සහ කණ්ඩායම් චර්යාවන්හි ප්‍රධාන වේ.

ලෝකය තාක්ෂණික වශයෙන් වඩාත් සමීප වෙමින් පවතින වටපිටාවක් තුළ කළමනාකරණය ක්‍රියාවට නැංවීමේ කටයුතු වර්ධනය වෙමින් පවතී. කළමනාකරණය පිළිබඳව බටහිර මෙන්ම පෙරදිග මතවාදයන්ට අනුව වුවද කළමනාකරණය ක්‍රියාවට නැංවීමේ දී අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම ඉතා වැදගත් සාධකයක් ලෙසට සළකා ඇත. ඒ අතරින් බටහිර කළමනාකරණ දාර්ශනිකයෙකු වූ හෙන්රි මින්ස්බර්ග්ට අනුව කළමනාකරුවකු ප්‍රධාන භූමිකා තුනක් යටතේ ඉටු කරන කාර්යයන් දහයක් නම්කර ඇත[18,19]. එම කාර්යයන් එකිනෙක විමසා බැලීමේ දී සෑම කාර්යයක් තුළම අන්තර් පුද්ගල සම්බන්ධතා ඉතාම වැදගත් වන බව තහවුරු කරගත හැකිය. කළමනාකරණ භූමිකා පහත පරිදි විස්තර කළ හැකිය.

### 3. අන්තර් පුද්ගල කාර්යයන්

කළමනාකරුවකු විසින් ඉටු කරන අන්තර් පුද්ගල කාර්ය වර්ගීකරණය යටතට තොරතුරු සහ අදහස් හුවමාරු කිරීමට අදාළව කළමනාකරුවන් විසින් ඉටු කරන කාර්යයන් ඇතුළත් වේ[20]. ඒ අනුව කළමනාකරුවකු විසින් ඉටු කළ යුතු අන්තර් පුද්ගල කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා සන්නිවේදනය වැනි ක්‍රමවේදයන් තුළින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම ඉතාම වැදගත් වේ. අන්තර් පුද්ගල කාර්යයන් යන්නට පහත උප කාර්යයන් අන්තර්ගත වේ.

ISSN: 2012-7235

### 3.1. නාමමාත්‍ර නායකයෙකු ලෙස කටයුතු කිරිම

නාමික හෝ සංකේතාත්මක නායකයා ලෙස කටයුතු කිරිම මේ යටතට ඇතුළත් වේ[21]. උදාහරණයක් ලෙස ආයතනය තුළ කටයුතු කරමින් සිටිය දී ආයතනය වෙත පැමිනෙන අමුත්තකු පිළිගැනීමට කටයුතු කිරීම, සාමාන්‍ය සේවකයෙකුගේ ඥාතී හිතවතුකුගේ අවමංගල අවස්ථාවන් වෙනුවෙන් සහභාගී වීම යනාදී කාර්යයන් කළමනාකරුවන් විසින් ඉටු කරනු ලබන්නේ ආයතනයේ නාමමාත්‍ර නායකයෙකු වශයෙනි. ඒ අනුව කළමනාකරුවන් වෙත නාමමාත්‍ර නායකයෙකු ලෙස තම කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවන් පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ.

### 3.2. නායකයෙකු ලෙස කටයුතු කිරිම

කළමනාකරුවන්ට තම සංවිධානමය අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කිරීමේ දී සිය අනුගාමිකයන් වෙත නියෝග උපදෙස් සපයමින් ඔවුන් අභිප්‍රේරණය කිරීම මඟින් ඒ සඳහා අවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීම සඳහා කළමනාකරුවන් හට නායකයෙකු ලෙස කටයුතු කිරීමට සිදු වේ. මෙලෙස කටයුතු කිරීමේ දී ඕනෑම  කළමනාකරුවකු වෙත කළමනාකරණ සහ කළමනාකරණ නොවන මට්ටමේ සේවකයන් සමඟ පවා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ.

### 3.3. සම්බන්ධීකරණ නිළධාරියෙකු ලෙස කටයුතු කිරිම

සංවිධානයක් තුළ විවිධ උප ඒකකයන් ඉටු කරනු ලබන විවිධ කාර්යයන් අවසාන පොදු අරමුණ ඉටු කර ගැනීම සඳහා එකට සම්බන්ධ කිරීමේ කාර්ය කළමනාකරුවන් විසින් ඉටු කරනු ලබයි[22]. සංවිධානකරණය යටතේ ආයතනික සම්පත් සහ අධිකාරීත්වය එක් එක් පාර්ශවයන් අතර බෙදා වෙන්කළ ද පොදු අරමුණු ඉටු කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා මෙම සම්බන්ධීකරණ කාර්ය ඉතාම වැදගත් ය. මෙම සම්බන්ධීකරණ කාර්ය සාර්ථකව ඉටු කිරීමට නම් ඕනෑම  කළමනාකරුවකු වෙත කළමනාකරණ සහ කළමනාකරණ නොවන මට්ටමේ සේවකයන් සමඟ පවා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම ඉතා වැදගත් ය.

## 4. තොරතුරු කාර්යයන්

තොරතුරු ලබා ගැනීම සහ බෙදාහැරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ කළමනාකරණ කාර්යයන් තොරතුරු කාර්යයන් යටතට අයත් වේ[23]. ඒ අනුව කළමනාකරුවන්ට සාර්ථකව තොරතුරු කාර්යයන් ඉටු කිරීම සඳහා අනෙකුත් කළමනාකරුවන් සමඟ මෙන්ම කළමනාකරණ නොවන සේවකයන් සමඟ ද නිවැරදි සන්නිවේදනයක් පවත්වාගෙන යාම ඉතාම වැදගත් වේ. සාමාන්‍යයෙන් කළමනාකරුවකු හට තොරතුරු කාර්යන්ට අදාළව පහත භූමිකා අදාළ වේ.

### 4.1. තොරතුරු රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරිම

කළමනාකරුවන් විසින් අභ්‍යයන්තර සහ බාහිර පාර්ශවයන්ගෙන් අවශ්‍ය තොරතුරු රැස් කිරීම මේ යටතට අදාළ වේ[24]. උදාහරණයක් ලෙස නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකුගෙන් නිෂ්පාදන ඒකක ප්‍රමාණයන් පිළිබඳව තොරතුරු රැස් කිරීම සහ පාරිභෝගිකයන්ගෙන් භාණ්ඩ හා සේවා වල ගුණත්වය සම්බන්ධයෙන් අදහස් විමසීම දැක්විය හැකිය. නිවැරදි තොරතුරු නිවැරදි වේලාවට මෙන්ම පහසුවෙන් සහ කාර්යක්ෂමව රැස්කිරීම සඳහා තොරතුරු සහිත අභ්‍යයන්තර සහ බාහිර පාර්ශවයන් සමග යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවන් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

ISSN: 2012-7235

**4.2. තොරතුරු බෙදාහරින්නෙකු ලෙස කටුයුතු කිරීම**

ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු කණ්ඩායමේ සමාජිකයන් සහ සහායකයන් සමඟ සන්නිවේදනය කිරීම කළමනාකරුවකු විසින් තොරතුරු බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම යටතට අයත් වේ[25]. ඒ අනුව තීරණ කාර්ය සඳහා වැදගත් වන නිවැරදිම තොරතුරු නිවැරදිම පුද්ගලයන් වෙත නිවැරදිවම බෙදාහැරීම සඳහා අන්තර් පුද්ගල කුසලතාව වැදගත් වන බව පෙන්වා දිය හැකි කරුණකි.

**4.3. තොරතුරු ප්‍රකාශකයෙකු ලෙස කටයුතු කිරීම**

කළමනාකරුවකු තොරතුරු ප්‍රකාශ කරන්නෙකු වශයෙන් සංවිධානය පිළිබඳව සහ එහි අරමුණු සම්බන්ධයෙන් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ වගකීමට බැඳී සිටී[26]. එසේ ආයතනයේ අරමුණු සම්බන්ධයෙන් තොරතුරු සම්ප්‍රේෂණය කරමින් ඒවා සඵල කර ගැනීම සඳහා නිවැරදි දායකත්වය ඔවුන් වෙතින් ලබා ගැනීමට අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන් සමඟ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම ඉතාම වැදගත් ය.

**5. තීරණ කාර්යයන්**

විධිමත් සහ අවිධිමත් මුලාශ්‍රවලින් කළමනාකරුවන් වෙත ලැබෙන තොරතුරු භාවිත කරමින් විවිධ අවස්ථාවන්ට අදාළව විවිධ ස්වරූපයේ තීරණ ගැනීමට කළමනාකරුවන්ට සිදු වේ. තීරණ ගැනීම කළමනාකරුවන්ගේ මුලික කාර්භාරය වන අතර එම තීරණ නිවැරදිව ක්‍රියාවට නැංවීම තුළින් ආයතනික අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කිරීම කළමනාකරණ නොවන සේවකයන්ගේ මුලික කාර්යභාරය වේ. කළමනාකරුවන්ට තීරණ කාර්යන් සාර්ථකව ඉටු කිරීම සඳහා අන්තර් පුද්ගල සම්බන්ධතාවන් පහත පරිදි වැදගත් වේ.

**5.1. ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීම**

සාර්ථක කළමනාකරුවකු විසින් පවත්නා ගැටළු විසඳමින්, නව අදහස් ජනිත කරමින් සහ එම නව අදහස් ක්‍රියාවට නංවමින් කටයුතු කළයුතු වේ[27]. නව අදහස් සංවිධානයක් තුළ ක්‍රියාවට නැංවීමේ දී සහ ඒ ආශ්‍රිත කටයුතු සිදු කිරිමේ දී සියළුම පාර්ශවයන් සමඟ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවන් පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

**5.2. ගැටළු සමනය කරන්නෙකු ලෙස කටයුතු කිරීම**

ආයතනයක් හෝ කණ්ඩායමක් තුළ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කිරීමේ දී අනපේක්ෂිත බාධාවන් පැමිණි විටදී කළමනාකරුවන් විසින් එම තත්ත්වය වෙනස් කරමින් නැවත සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමට කටයුතු කළයුතු වේ[28]. නිවැරදිව ගැටළු හඳුනා ගැනීමට සහ ඒවා නිවැරදිව සමථයකට පත් කිරීමට නම් නිවැරදිව පුද්ගලයන් සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම අවශ්‍ය කරුණකි.

**5.3. සම්පත් බෙදාහරින්නෙකු ලෙස කටයුතු කිරීම**

කළමනාකරුවන් විසින් සංවිධානයේ සම්පත් යෙදවීමට වඩාත් සුදුසු ස්ථාන නිවැරදිව හඳුනා ගත යුතු වේ[29]. සම්පත් බෙදා වෙන් කිරිම, අවශ්‍ය අරමුදල් සපයා ගැනීම අනෙකුත් සම්පත් බෙදාහැරීම මෙන්ම මානව සම්පත බෙදා වෙන්කිරීම යන කාර්‍යයන් මෙයට අදාළ වේ. විශේෂයෙන්ම මානව සම්පත නිවැරදිව කාර්යන් සඳහා බෙදා වෙන් කිරීමේ දී ඔවුන් සතු විශේෂ කුශලතාවන් නිවැරදිව හදුනා ගැනීම ආදිය සඳහා මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යාම ඉතාම වැදගත් වේ.

ISSN: 2012-7235

### 5.4. සාකච්ඡා කරන්නකු ලෙස කටයුතු කරීම

කළමනාකරුවකු ලෙස විවිධ සාකච්ඡාවන් සඳහා සහභාගී වීමට සහ විවිධ සාකච්ඡාවන් අධීක්ෂණය කිරීමට සිදු වේ[30]. මේ සඳහා කළමනාකරුවකු වෙත අන්තර් පුද්ගල සම්බන්ධතාවන් වැදගත් වේ.

## 6. අන්තර් පුද්ගල සම්බන්ධතාවල වැදගත්කම

සමාජයක් යනු මිනිසුන්ගේ එකතුවකි. මිනිසා විසින් ජීවත් වීම සඳහා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු ආහාර, ඇඳුම්, නිවාස වැනි මූලික මිනිස් අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් නොවේ[31].මිනිසාගේ මුල්ම අරගලය තනිකමට එරෙහිව සිදු කරනු ලබන අරගලය බව බ්‍රහමජාල සූත්‍රයේ ඊශ්වර නිර්මාණවාදයේ ප්‍රභවය පිළිබඳව එන විචාරණයෙන් දැන ගත හැක[32]. නමුත් මිනිසාගේ මූලාරම්භයේ සිටම විවිධ සාධක අනුව වෙනස්කම් දැකගත හැකිය[33]. මිනිසුන්ගේ එකතුවෙන් නිර්මාණය වන සමාජයේ ද මිනිසා විසින් ඇති කර ගත් වෙනස්කම් බොහොමයක් දැකගත හැකි වේ. මිනිසුන්ගේ එකතුවෙන් නිර්මාණය වන සමාජයේ මිනිසා විසින් ඇති කර ගත් වෙනස්කම් බොහොමයක් දැක ගත හැකිය. වර්තමානයේ මෙන්ම අතීතයේ ද සමාජයේ මිනිසුන් අතර විවිධ සාධක පදනම් කර ගනිමින් කාණ්ඩ ගත වී කටයුතු කල බවට සාධක හමු වේ. බටහිර සමාජයේ වර්ණ භේද වාදය, භාරතීය සමාජයේ කුල භේදය මේ අතර ප්‍රධාන වේ[34]. සමාජයේ පුද්ගලයන් විවිධ සාධක පදනම් කර ගනිමින් මෙලෙස බෙදී සිටීම නිසා සමාජයේ එක් පුද්ගල කණ්ඩායමක් සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් පීඩනයට ලක් කරමින් තවත් කොටසක් නැගී සිටීම බොහෝවිට සිදුවිය. මිනිසා විසින් කෘතීම වශයෙන් සමාජයට ආරෝපණය කරනු ලබන මෙම භේදයන් නිසා පුද්ගලයන්ගේ නිදහස සීමා වීම, සහජ කුසලතාවන්ට ඉඩක් නොලැබීම වැනි අවාසනාවන්ත තත්ත්වයන්ට මුහුණ දීමට ද සිදුව ඇත[35]. මිනිසා සමේ වර්ණයේ සිට ජාතී, ආගම්, කුල, දේශ සීමා ආදීය පදනම් කරගෙන වෙන් වෙන් වශයෙන් බෙදී සිටීම නිසා යුද්ධය වැනි අවාසනාවන්ත ඉරණම්වලට මුහුණ දීමට සිදුවූ අවස්ථා පිළිබඳව ලෝක ඉතිහාසයේ පාඩම් අඩු නැත.

## 7. අන්තර් පුද්ගල සම්බන්ධතා පිළිබඳව බෞද්ධ ඉගැන්වීම්

බුදු දහම හුදෙක් අධ්‍යාත්මික පවිත්‍රතාවය සඳහා මඟ පෙන්වන ධර්මයකි. එම ආධ්‍යාත්මික පවිත්‍රතාවයේ දී මිනිසා මමත්වය සපුරා බැහැර කර ලොව කිසිවක නොඇලී නොගැටී කටයුතු කළ හැකි පුද්ගලයෙකි[35]. නමුත් එම තත්ත්වයට පත්වීම කෙටි කාලයකින් සිදු කළ හැකි නොවේ. එම නිසා මෙම අධ්‍යාත්මික පවිත්‍රතාවය ළඟා කර ගන්නා තෙක් භෞතික ජීවිතයේ සුඛිත මුදිත භාවය ප්‍රතික්ෂේප කරීමක් බුදු දහම තුළින් කිසිසේත්ම අරමුණු නොකරයි[36]. එම නිසා භෞතික පිවිතයේ සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම බුදු දහම තුළින් ලබා ගත හැකි අවස්ථා, සිද්ධි, දේශනා ආදීය බොහෝ තැන් වලදී හමු වේ. ඒ අතරින් අල්පේච්ඡතාවය හුරු කරන ලද  පුද්ගලයෙකුට, අත්ථි සුඛය (ධෛර්‍ය සම්පන්නව ඉපයූ ධනයක් ඇත යන සතුට), භෝග සුඛය (දැහැමින් උපයාගත් භෝගයන් භුක්ති විදිමේ සතුට), අණන සුඛය (කිසිවෙකුට ණය නොවීමේ සතුට) සහ අනවජ්‍ය සුඛය (කයෙන්, මනසින් හෝ වචනයෙන් වැරදි නොකර සිටිමී යන සතුට) යනාදී වශයෙන් මෙලොව තුළදීම භුක්ති විදිය හැකි සුඛයන් වර්ග හතරක් පිළිබඳව අන්ගුත්තර නිකායේ අණන සූත්‍රයේ සඳහන් වේ[37].

සමාජ ක්‍රමය තුළ මානව සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා බෞද්ධ දර්ශනය තුළින් ලද ආභාෂය අති මහත්ය. කල්‍යාණ මිත්‍රතාවය හෙවත් යහපත් අන්තර් පුදගල සම්බන්ධතාව බුදු දහම තුළ විවිධ අවස්ථා තුළදී අගය කොට දක්වා ඇත. ඒ අතරින් බුදුරජානන් වහන්සේ විසින් සිගාල නම් ගෘහ පුත්‍රයාට සදිසා නමස්කාරය අර්ථවත්ව සිදු කිරීම සඳහා දේශනා කළ

ISSN: 2012-7235

සිඟාලෝවාද සූත්‍රයේ දී සමාජයේ විවිධ පාර්ශවයන් සමඟ යහපත් සම්බන්ධතාවය පවත්වාගෙන යාම සඳහා ඉටු කළ යුතු යුතුකම් සහ වගකීම් පිළිබඳව පැහැදිළිව කරුණු ඉදිරිපත් කර තිබේ[38]. එම සදිසා නමස්කාරයෙන් අර්ථ දැක්වෙන කරුණු පහත පරිදි වේ.

**වගු අංක. 01**

සමාජයේ විවිධ පාර්ශවයන් සමඟ යහපත් සම්බන්ධතාවය පවත්වාගෙන යාම සඳහා ඉටු කළ යුතු යුතුකම් සහ වගකීම්[39,40]

| | |
|---|---|
| **උතුරු දිශාව** | |
| **දරුවන් විසින් දෙමාපියන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **දෙමාපියන් විසින් දරුවන් සම්බන්ධයෙන් ඉටු කළයුතු යුතුකම්.** |
| මව්පියන් පෝෂණය කිරීම.<br>පැමිණි කටයුතු ඔවුන් වෙනුවෙන් කර දීම.<br>කුල පරපුර රැකීම.<br>උරුම වන වස්තුව නිවැරදිව පරිහරණය කිරීම.<br>මිය පරලොව ගිය පසු ඔවුන් වෙනුවෙන් පිං දහම් සිදු කර ඔවුන් වෙත අනුමෝදන් කිරීම. | පවින් වළක්වා ගැනීම.<br>යහපතෙහි යෙදවීම.<br>ශිල්ප ඉගැන්වීම.<br>සුදුසු ආවාහ විවාහ කර දීම.<br>නිසි කල වයස එළඹි පසු දායාද පවරා දීම. |
| **දකුණු දිශාව** | |
| **ශිෂයන් විසින් ඇඳුරුවරුන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **ඇඳුරුවරුන් විසින් ශිෂයන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** |
| හුනස්නෙන් නැඟී සිටීම.<br>උපස්ථාන කිරීම.<br>මනාව සවන් දීම.<br>උගන්වන කරුණු සකසා දැන ගැනීම.<br>වතාවත් ඉටු කිරීම. | සුවිනීත වන සේ හික්මවයි.<br>උගත හැකි වන සේ උගන්වයි.<br>සියළු ශිල්පයන් කියන්නේ හා පළ කරන්නේ වෙයි.<br>මිතුරු කුලුපඟයින් හට හඳුන්වා දෙයි.<br>හැම තැන්හි රැකවරණය සළසයි. |
| **බටහිර දිශාව** | |
| **ස්වාමියා විසින් අඹුව (පතිනිය) සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **අඹුව (පතිනිය) විසින් ස්වාමියා සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** |
| සම්මාන කිරීම.<br>අවමාන නොකිරීම.<br>අනාචාරයෙහි නොහැසිරීම.<br>නිවසේ කටයුතුවල අධිපති බව පවරා දීම.<br>ඇඳුම් පැළඳුම් සහ ආභරණ සපයා දීම. | මනා සංවිධිත බවකින් යුතුව කටයුතු කිරීම.<br>පිරිවාර ජනයාට මනාව සංග්‍රහ කිරීම.<br>අනාචාරයෙහි නොහැසිරීම.<br>රැස් කල ධනය රැක දීම.<br>සියළු කටයුතු වල දක්ෂ සහ අනලස් බව. |
| **නැගෙනහිර දිශාව** | |
| **මිතුරන් විසින් මිතුරන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **මිතුරන් විසින් පෙරළා මිතුරන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** |
| දානය.<br>ප්‍රිය වචනය.<br>අර්ථ චර්යාව.<br>සමානාත්ම තාවය.<br>අවංක වීම. | පමා වුවද රැකී.<br>පමා වූ විට වස්තුව රැක දේ.<br>බියට පිහිට වේ.<br>ආපදාවන්හිදී අතහැර නොයයි.<br>දරු මුනුබුරන් හට සංග්‍රහ කරයි. |
| **යට දිශාව** | |
| **ස්වාමියා විසින් සේවකයන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **සේවකයන් විසින් ස්වාමියා සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** |
| ශක්තීන්ට අනුලෝම වන පරිදි කාර්යන් සංවිධානය කර දීම.<br>නිසි පරිදි පඩිනඩි සහ ආහාර දීම.<br>ගිලන් වූ කළ ප්‍රතිකාර කිරීම.<br>රසවත් ආහාර බෙදා දීම.<br>අවශ්‍යතාවය මත නිවාඩු ලබා දීම. | ස්වාමියාට පෙර පිබිදෙයි.<br>ස්වාමියාට පසු නින්දට යයි.<br>සොරකම් නොකරයි.<br>දුන් කාර්ය මනාව ඉටු කරයි.<br>ප්‍රශංසා පතුරවයි. |
| **උඩ දිශාව** | |
| **දායකයන් විසින් මහණ බමුණන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්.** | **මහණ බමුණන් විසින් දායකයන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම්** |
| මෛත්‍රී සහගත කායික ක්‍රියාවන් දැක්වීම.<br>මෛත්‍රී සහගත මානසික ක්‍රියාවන් දැක්වීම.<br>මෛත්‍රී සහගත වචන කථා කිරීම. | පවින් වළක්වා ගනී.<br>යහපතෙහි පිහිටුවයි.<br>පහන් සිතින් අනුකම්පා කරයි. |

ISSN: 2012-7235

| | |
|---|---|
| නොවැසූ දොරින් යුතුව සංග්‍රහ කිරීම.<br>ආහාර පාන ආදීය මඟින් සංග්‍රහ කිරීම. | නොඇසූ දහම් අසන්නට සළස්වයි.<br>ඇසූ දහම් කරුණු වල සැක හැර දක්වයි.<br>සුගතියට මඟ පාදයි. |

මෙම පුද්ගල කණ්ඩායම් ආදේශ කරමින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා ඉතා පුළුල් මඟපෙන්වීමක් ලබා දී ඇති බව මෙම එක් එක් කණ්ඩායම් වෙත ඉටු කළ යුතු යුතුකම් සහ වගකීම් පිළිබඳව විමසීමේ දී කරුණු පැහැදිළි වේ.

කුඩා කාලයේදී අප පළමුව මෙන්ම නිරතුරුවම සම්බන්ධතා පවත්වන ප්‍රධානතම පාර්ශවය වන්නේ දෙමාපියන්ය. එම නිසා සිඟාලෝවාද සූත්‍රයේ උතුරු දිශාව සඳහා ආදේශ කරනුයේ දෙමාපියන්ය. මව්පියන් පෝෂණය කිරීම, පැමිණි කටයුතු ඔවුන් වෙනුවෙන් ඉටුකර දීම, කුල පරපුර රැකීම, උරුම වන වස්තුව නිවැරදිව පරිහරණය කිරීම, මිය පරලොව ගිය පසු ඔවුන් වෙනුවෙන් පිං දහම් සිදු කර ඔවුන් වෙත අනුමෝදන් කිරීම යනාදී යුතුකම් දරුවන් විසින් දෙමාපියන් වෙනුවෙන් ඉටු කිරීම ඔවුන් නැමදීම යන්නෙන් අර්ථ ගැන්වේ. සාර්ථක දෙමාපිය දූදරු සම්බන්ධතාවයක් සඳහා දරුවන් විසින් දෙමාපියන් වෙත ඉහත යුතුකම් ඉටු කරනු ලැබූ විට දෙමාපියන් විසින් පෙරළා එවැනි දරුවන් පවින් වළක්වා ගැනීම, යහපතෙහි යෙදවීම, ශිල්ප ඉගැන්වීම, සුදුසු ආවහා විවාහ කර දීම, නිසි කල වයස එළඹි පසු දායාද පවරා දීම මඟින් යුතුකම් ඉටු කරයි.

ජීවිතයේ දී ඉන් පසුව පුද්ගලයා අධ්‍යාපනය වෙත යොමු වන අතර එහිදී තම ගුරුවරුන් වෙත ඉටු කළයුතු මූලික යුතුකම් දකුණු දිශාව නැමදීම යටතේ විස්තර කර ඇත. සිඟාලෝවාද සූත්‍රය අනුව ශිෂ්‍යයන් විසින් හුනස්නෙන් නැගී සිටීමෙන්, අවශ්‍ය විට දී උපස්ථාන කිරීම, උගන්වන කරුණු පිළිබඳව මනාව සවන් දීම, උගන්වන කරුණු සකසා දැන ගැනීම සහ වතාවත් ඉටු කිරීම යනාදියෙන් තම ගුරුවරුන් වෙත මූලික යුතුකම් ඉටු කළ යුතු වේ. එසේ ශිෂ්‍යයන් විසින් තම ගුරුවරුන් වෙත සිය යුතුකම් ඉටු කරන විට ගුරුවරුන් විසින් ද තම ශිෂ්‍යයන් වෙත පෙරළා යුතුකම් කිහිපයක් ඉටු කළ යුතු වේ. එම යුතුකම් ලෙස සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වන්නේ සුවිනීත වන සේ හික්මවීම, උගත හැකි වන සේ ඉගැන්වීම, සියළු ශිල්පයන් ඉගැන්වීම, මිතුරු කුලුපගයින් හට හඳුන්වා දීම, හැම තැන්හි රැකවරණය සැළසීම යනාදියයි. මෙම දෙපිරිස විසින් සිය යුතුකම් කොටස නිවැරදිව ඉටු කිරීම නිසා යහපත් සහ දීර්ඝ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවය තහවුරු වේ[41].

මිනිසාගේ පවුල් ජීවිතය සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය වන යුතුකම් සමුදායක් සිඟාලෝවාද සූත්‍රය බටහිර දිශාව මුල් කරගෙන ඉදිරිපත් කර ඇත. සාර්ථක පවුල් ජීවිතයක් සඳහා ස්වාමියා විසින් අඹුව වෙත සම්මාන කිරීම, අවමාන නොකිරීම, අනාචාරයෙහි නොහැසිරීම, නිවසේ කටයුතුවල අධිපති බව පවරා දීම, ඇඳුම් පැළඳුම් සහ ආභරණ සපයා දීම යන කටයුතු යුතුකම් ලෙස සළකා ඉටු කළ යුතු වේ. එසේ තමන් වෙත යුතුකම් ඉටු කරන ස්වාමියා වෙනුවෙන් මනා සංවිධිත බවකින් යුතුව කටයුතු කිරීම, පිරිවාර ජනයාට මනාව සංග්‍රහ කිරීම, අනාචාරයෙහි නොහැසිරීම, රැස් කල ධනය රැක දීම සහ සියළු කටයුතු වල දක්ෂ සහ අනලස්ව කටයුතු කිරීම මඟින් යුතුකම් ඉටු කළ යුතු වේ.

සමාජයේ ජීවත් වීමේ දී විවිධ මිතුරන් සමඟ කටයුතු කිරීමට සිදු වේ. මිතුරන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් නැගෙනහිර දිශාව මුල් කර ගනිමින් කරුණු ඉදිරිපත් කර ඇත. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව සහ සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තුන්ගෙන් අවංකවම සංග්‍රහ කරන විට පමා වූ විට රැකගනිමින්, පමා වූ විට වස්තුව රැක

ISSN: 2012-7235

දෙමින්, බියට පිහිට වෙමින්, ආපදාවන්හීදී අතහැර නොයා සිටිමින් සහ දරු මුනුබුරන් හට සංග්‍රහ කිරීම යනාදීයෙන් යුතුකම් ඉටුකළ යුතුය.

මිනිසාගේ ජීවිතයේ තවත් ඉතාම වැදගත් පැතිකඩක් වන්නේ රැකියා ජීවිතයයි. රැකියා ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වැදගත් වන කරුණු යට දිශාව මුල් කර ගනිමින් දේශණා කර ඇති බව සිගාලෝවාද සුත්‍රයේ සඳහන් වේ. එහිදී ස්වාමියා විසින් ශක්තීන්ට අනුලෝම වන පරිදි කාර්යන් සංවිධානය කර දීම, නිසි පරිදි පඩිනඩි සහ ආහාර දීම, ගිලන් වූ කළ ප්‍රතිකාර කිරීම, රසවත් ආහාර බෙදා දීම සහ අවශ්‍යතාවය මත නිවාඩු ලබා දීම යනාදී වශයෙන් තම සේවකයන් වෙත යුතුකම් ඉටු කරන විට ස්වාමියාට පෙර පිබිදෙමින්, ස්වාමියාට පසු නින්දට යමින්, සොරකම් නොකර සිටීමෙන්, දුන් කාර්ය මනාව ඉටු කරමින් සහ ප්‍රශංසා පතුරවීමෙන් තම ස්වාමියා කෙරෙහි කටයුතු කිරීම මඟින් යහපත් සේව්‍ය සේවක සම්බන්ධතාවය තහවුරු කර ගත හැකිය.

මිනිසා අධ්‍යයාත්මික සුවය පිණිස විවිධ ආගමික දර්ශනයන් මත විශ්වාසයෙන් යුතුව කටයුතු කරයි. ඒ අනුව තමන් විසින් විශ්වාස කරනු ලබන ආගමික දර්ශනයේ මහණ බමුණන් වෙත ගිහියන් විසින් මෛත්‍රී සහගත කායික ක්‍රියාවන් දැක්වීම, මෛත්‍රී සහගත මානසික ක්‍රියාවන් දැක්වීම, මෛත්‍රී සහගත වචන කථා කිරීම, නොවැසූ දොරින් යුතුව සංග්‍රහ කිරීම සහ ආහාර පාන ආදීය මඟින් සංග්‍රහ කිරීම යනාදී ලෙස කටයුතු කළ යුතු බවත් එවැනි දායකයන් සම්බන්ධයෙන් මහණ බමුණන් විසින් පවින් වළක්වා ගනිමින්, යහපතෙහි පිහිටුවමින්, පහන් සිතින් අනුකම්පා කරමින්, නොඇසූ දහම් අසන්නට සළස්වමින්, ඇසූ දහම් කරුණු වල සැක හැර දක්වමින් සහ සුගතියට මඟ පාදමින් සිය යුතුකම් ඉටු කළ යුතු බව සිගාලෝවාද සුත්‍රයේ උඩ දිශාව මුල් කර ගෙන දේශණා කර ඇත.

කිසියම් පුද්ගලයෙකු දයානුගත හැඟීමෙන් හෝ පෞද්ගලිකව සළකා අනෙක් පුද්ගලයන් සමඟ සම්බන්ධ වීම මිත්‍රත්වයයි (A person attached to another by feelings of affection or personal regard)[42]. ඒ අනුව මිත්‍රත්වය යන්න අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ ප්‍රතිඵලයයි. යහපත් මිත්‍රත්වය හෙවත් කල්‍යාණ මිත්‍රත්වයේ වැදගත්කම සම්බන්ධයෙන් බෞද්ධ දර්ශනය තුළ ඉදිරිපත් කර ඇති කරුණු සැළකීමේ දී ඒ සඳහා ප්‍රධාන ස්ථානයක් හිමි වන බව තහවුරු වේ. කල්‍යාණ මිත්‍රත්වයේ වැදගත්කම සම්බන්ධයෙන් කරුණු හෙළි කරන සුත්‍ර ගනනාවක් බෞද්ධ දර්ශනය තුළ හමු වේ. ඒ අතර දීඝ නිකායේ සිගාලක සුත්‍රයේ ඇසුරු කිරිමට සුදුසු මිතුරන් වර්ග හතරක් පිළිබඳව විස්තර ඇතුළත් වේ[43]. එම මිතුරන් වර්ග හතර පහත විස්තර කර ඇත.

**7.1. උපකාරක මිතුරා**

තම මිතුරන් හට කිසියම් උපකාරයක් අවශ්‍ය වූ විටකදී හැරදමා නොගොස් උපකාර කරන මිතුරන් වේ[43]. බොහෝ විටදී කිසියම් පුද්ගලයෙකු හට කිසියම් උපකාරයක් අවශ්‍ය වන්නේ කරදරයක් හෝ විපතක් සිදු වූ විටදී වේ. එවැනි විටකදී උපකාර කිරිමට ඉදිරිපත් වීම විපතට පත් පුද්ගලයන්ට විශාල අස්වැසිල්ලක් ගෙන දෙන්නකි. මිතුරාගේ විපතකදී ඔවුනට උපකාර කරමින් ඔවුන් වෙත අස්වැසිල්ලක් වීම උපකාරක මිත්‍රයා තුළ දැකිය හැකි ගති ලක්ෂණයකි. ඒ අනුව උපකාරක මිත්‍රයන් සමඟ අඛණ්ඩ අන්තර් පුද්ගල සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට උත්සුක විය යුතුය.

**7.2. සමාන සුඛ දුක්ඛ මිතුරා**

තම මිතුරාගේ දුක සහ සතුට යන ඕනෑම තත්වයකදී ඔහු හෝ ඇයව තනිකර දමා නොගොස් එකට සිටින මිතුරන් වේ[44]. සතුට සහ දුක යන තත්වයන් ජීවත් වීමේදී සරල

ISSN: 2012-7235

සමාන්‍ය තත්වයන් වේ. පුද්ගලයන් සතුට සැමරීමට මෙන්ම දුක බෙදා හදා ගැනීමට තම මිතුරන සමඟ එකතු වේ. සතුට මිතුරන් සමඟ බෙදා හදා ගැනීම තුළින් එය තව තවත් වැඩි වන අතර දුක මිතුරන් සමඟ බෙදා හදාගැනීම තුළින් එය තුනී කර ගත හැකිය. නමුත් සතුට බෙදා ගන්නට එක් වන සියළු දෙනා  දුක බෙදා හදා ගන්නට එක් නොවේ. තම මිතුරන්ගේ සතුටු අවස්ථවන් හිදී මෙන්ම දුක් මුසු අවස්ථාවන්හිදී ද සමාන ලෙස එකට රැඳෙමින් කටයුතු කරන මිතුරන් සමාන සුඛ දුක්ඛ මිතුරන් ලෙස  හඳුන්වයි. මෙවැනි මිතුරන් සමඟ අඛණ්ඩ අන්තර් පුද්ගල සම්බන්ධතාවක් පවත්වාගෙන යාම ඉතාම වැදගත් වේ.

**7.3. අත්ථක්ඛායි මිතුරා**

මිනිසුන් විසින් විවිධ අවස්ථවන්ට අදාළව විවිධ ක්‍රියාවන් නිරත වේ. නමුත් එම ක්‍රියාවන් සියල්ල නිවැරදි නොවේ. තම මිතුරන් විසින් විවිධ වැරදි ක්‍රියාවන් හි නිරත වන විටදී එම ක්‍රියාවන්ගේ අර්ථය පහදා දෙමින් නිවැරදි මාවතකට යොමු කරවන මිත්‍රයන් අත්ථක්ඛායි මිත්‍රයන් ලෙස හඳුන්වයි[45]. මෙවැනි මිතුරන් සමඟ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම තුළින් සියළු දෙනා වෙත යහපත සැළසේ. ඒ අනුව තමන් විසින් සිදු කරන වැරදි පෙන්වා දෙමින් නිවැරදි කරන පුද්ගලයන් සමඟ යහපත් අඛණ්ඩ සම්බන්ධතාවන් පවත්වාගෙන යාම දිරිමත් කර ඇත.

**7.4. අනුකම්පක මිතුරා**

මිනිස් ජිවිතයේදී විටක සතුට මෙන්ම තවත් විටක දුක උරුම වීම වැළැක්විය නොහැකි කරුණකි. නමුත් කිසියම් පුද්ගලයෙකු මුහුණ දෙන දුක්මුසු අත්දැකීම් තනිවම විඳ දරා ගැනීමට ඇති හැකියාව ඔවුන්ගේ මානසික මට්ටම අනුව වෙනස් වේ. තම මිතුරන් හට දුකක් කරදරයක් සිදු වූ විට එය තමන්ට සිදු වූ දුකක් කරදරයක් ලෙස සළකා මිතුරන් කෙරෙහි අනුකම්පා සිත් ඇතිව කටයුතු කිරීමට හැකි මිතුරන් අනුකම්පක මිතුරන් ලෙස හඳුන්වයි[46]. එවැනි අනුකම්පක මිතුරන් සමඟ යහපත් අඛණ්ඩ අන්තර් පුද්ගල සම්බන්ධතාවය පවත්වාගෙන යාම දිරිමත් කර ඇත.

ඒ අනුව අන්තර් පුද්ගල සම්බන්ධතාවන් පැවැත්වීමට වඩාත් සුදුසු පුද්ගලයන්ගේ ගති ලක්ෂණ ලෙස  විපතකදී අස්වැසිල්ලක් වීම, සතුටු අවස්ථවන් හිදී මෙන්ම දුක් මුසු අවස්ථාවන්හිදී ද සමාන ලෙස එකට රැඳෙමින් කටයුතු කිරීම, වැරදි ක්‍රියාවන් හි නිරත වන විටදී එම ක්‍රියාවන්ගේ අර්ථය පහදා දෙමින් නිවැරදි මාවතකට යොමු කිරීම සහ අනුකම්පා සිත් ඇතිව කටයුතු කිරීමට හැකි වීම පෙන්වා දිය හැකිය. ඒ අනුව කිසියම් පුද්ගලයකු ඉහත දක්වන ලද ගති ලක්ෂණ හුරු කර ගැනීම තුළින් අන්තර් පුද්ගල කුසලතාවය වර්ධනය කර ගත හැකිය.

ඉහත දක්වන ලද යහපත් මිතුරන් අරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කරුණු පහක් පිළිබඳව තවදුරටත් දීඝ නිකායේ සිඟාලක සූත්‍රයේ සඳහන් වේ[47]. යහපත් මිතුරන් අරක්ෂා කර ගැනීම සඳහා ප්‍රගුණ කළ යුතු ලක්ෂණ පහත පරිදි වේ.

1. පරිත්‍යාග කිරිම.
2. ප්‍රිය වචන කථා කිරීම.
3. යහපතෙහි හැසිරීම.
4. සමාන ලෙස සැළකීම.
5. අනුන් නොරැවටීම.

මිතුරු ඇසුර පුද්ගල ජීවිතයට විශාල බලපෑමක් සිදු කරයි.යහපත් මිතුරු ඇසුර දියුණුවට මෙන්ම අයහපත් මිතුරු ඇසුර පිරිහිමටත් හේතු වේ. එසේ ඇසුරු කිරීම නිසා පිරිහීමට

ISSN: 2012-7235

හේතුවන මිතුරන් මෙන් හැසිරෙන නමුත් සැබැවටම මිතුරන් නොවන පිරිස මිත්‍ර ප්‍රතිරූපකයන් ලෙස හඳුන්වයි. මිත්‍ර ප්‍රතිරූපකයෝ හතර දෙනෙක් පිළිබඳවද දීඝ නිකායේ සිගාලක සුත්‍රයේ කරුණු සඳහන් වේ[48]. එම මිත්‍ර ප්‍රතිරූපකයන් පහත දක්වා ඇත.

### 7.5. අඤ්ඤදත්ථුහර

විශ්වාසය සහ සුහඳත්වය පසෙකලා මිතුරන්ගෙන් යමක් ඉල්ලා ගැනීමේ අරමුණ ඇතිව කටයුතු කරමින් මිත්‍රයන් මෙන් හැසිරෙන පුද්ගලයන් අඤ්ඤදත්ථුහර ලෙස හඳුන්වයි[49]. මෙවැනි පුද්ගලයන් ඇසුරු කිරීම තමාගේ සම්පත් නාස්තිවීම පමණක් සිදු වන අතර එයින් කිසිදු යහපතක් සිදු නොවේ. එම නිසා තමන්ට යමක් ඉල්ලා ගැනීම සඳහා පමණක් ආශ්‍රය කරන මිතුරන් හඳුනාගෙන ඔවුන් බැහැර කිරීම කළ යුතුය. එමෙන්ම තමන් වෙත මෙම ගති ලක්ෂණය උපමා කොට ගත් විට තමන්ගේ වැඩකටයුතු පහසු කර ගැනීම සඳහා පමණක් පුද්ගල සම්බන්ධතා පවත්වා නොගත යුතුය. ඒ අනුව යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවයකට සම්බන්ධ වන සියළු පාර්ශවයන් වෙත එමගින් යහපත සැළසීම තහවුරු විම එම සම්බනධතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැදගත් වේ.

### 7.6. වචීපරම

යම් විපතකදී උපකාර අපේක්ෂාවෙන් තමන් වෙත පැමිණෙන මිත්‍රයන් වෙත වචනයෙන් පමණක් උපකාර කරන මිතුරන් වචීපරම මිතුරන් ලෙස හඳුන්වයි[50]. වචීපරම මිතුරන් නිසා පුද්ගලයන් මුලාවට පත්වේ. එම නිසා කිසිම පුද්ගලයෙකුට යහපතක් සිදු නොවේ. ඒ අනුව වචීපරම මිතුරන් ඇසුරු කිරීම සඳහා සුදුසු නොවේ. අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම සඳහා මෙම ගති ලක්ෂණයේ පවතින වැදගත්කම විමසීමේ දී තමන් ද කිසිවිටකත් තමන්ට සිදු කළ නොහැකි උපකාරයක් සම්බනධයෙන් මිතුරන් මුලා නොකර සිටීමේ ගති ලක්ෂණය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රගුණ කිරීමට උත්සුක විය යුතුය.

### 7.7. අපාය සහයක

බෞද්ධ දර්ශනය තුළ ගිහි ජීවිතයේ දී අනුගමනය කළ යුතු මූලික විනය පංච ශීලය මගින් දක්වා ඇත. ඒ අනුව කටයුතු කිරීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමස්තයක් ලෙස අවසානයේ සමාජ සංවර්ධනයට ද හේතු වේ. නමුත් පුද්ගලයන්ට ඇසුරු කිරීම සඳහා මුණ ගැසෙන ඇතැම් මිතුරන් නිසා මෙම හික්මීම විනාශ කර ගනී. එනම් ඇතැම් සම්බන්ධතාවන් පුද්ගලයන් වැරදි චර්යාවන් වෙත හුරු කරයි. මෙහිදී තමන්ගේ යහපත් චර්යාවන් වැරදි මඟට යොමු කරන මිත්‍රයන් අපාය සහයක මිතුරන් ලෙස හඳුන්වයි[51]. ඒ අනුව අපාය සහයක මිතුරාගේ මූලික ලක්ෂණය වන්නේ තම මිතුරන් වැරදි චර්යාවන් වෙත යොමු කිරිමයි. මෙසේ වැරදි චර්යාවන් වෙත හුරු කරන අපාය සහයක මිතුරන් ඇසුරු නොකළ යුතුය. මෙම ඉගැන්වීම තුළින් අන්තර් පුද්ගල සම්බන්ධතාවන් ප්‍රගුණ කිරීම සඳහා භාවිතා කළ යුතු ගති ලක්ෂණය වන්නේ කිසි විටකත් කිසිම අරමුණක් වෙනුවෙන් පුද්ගලයන් වැරදි චර්යාවන් වෙත හුරු නොකළ යුතු බවයි.

### 7.8. අනුප්‍රියභාණී

සමාජයේ පුද්ගලයන් විවිධ නිවැරදි ක්‍රියාවන්හි මෙන්ම ඇතැම් විට වැරදි ක්‍රියාවන් හි නිරත වේ. නමුත් බොහෝ පුද්ගලයන් තමන් සිදු කරන කාර්යයන් නිවැරදි ලෙස අර්ථ දක්වයි. එම නිසාම බොහෝ පුද්ගලයන් තමන් නිවැරදි යයි විශ්වාස කරන වැරදි ක්‍රියාවන් ප්‍රසංශා කිරීම ඉහළින් පිළිගැනීමටත් නින්දාවන් ප්‍රතික්ෂේප කිරිමටත් උත්සුක වේ. ඒ අනුව කිසියම් පුද්ගලයෙකු විසින් සිදු කරන වැරදි හෝ නිවැරදි ඕනෑම ක්‍රියාවක් ප්‍රසංශා කිරීම මගින් තමන් වෙත පක්ෂපාතීත්වය ලබා ගත හැකි බව විශ්වාස කරයි. එම විශ්වාසය මත පදනම්ව තම හිත මිතුරන් විසින් ඉටු කරන ඕනෑම වැරදි ක්‍රියාවන් පවා එම ක්‍රියාවේ ආදීනව දැන දැනම

ISSN: 2012-7235

අනුමත කර මිතුරන් අනුප්‍රියභාණී මිතුරන් ලෙස හඳුන්වයි[52]. එවැනි පුද්ගලයන් දිගින් දිගටම ආශ්‍රය කිරීම නිසා තමන් විසින් සිදු කරන වැරදි කිසිවිටකත් නිවැරදි නොවන බැවින් පිරිහීමට හේතු වේ. එමෙන්ම යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා කිසි විටකත් ඔවුන් විසින් සිදු කරන වැරදි චර්යාවන් අනුමත නොකළ යුතුය.

ඇතැම් පුද්ගල සම්බන්ධතා ඒක පාර්ශවීය වශයෙන් අවසන් වේ. එයට හේතු වන්නේ එම සම්බන්ධතාවය තව දුරටත් පවත්වාගෙන යාම සඳහා ඊට සම්බන්ධ එක් පාර්ශවයක් විසින් ප්‍රතික්ෂේප කිරීමයි. ඒ සඳහා විවිධ හේතුන් බලපෑ හැකිය. ඒ අතරින් මිතුරන් අතින් සිදු වන අතපසු වීම් හේතුවීම ප්‍රධාන වේ. මිතුරන් අතින් සිදු වන අතපසු වීම් සම්බන්ධයෙන් අනුකම්පා කළ යුතු කරුණු පහක් පිළිබඳව දීඝ නිකායේ සිගාලක සුත්‍රයේ තවදුරටත් කරණු සඳහන් වේ[53]. එම කරුණු පහත දක්වා ඇත.

1. මිතුරා ආරක්ෂා කර ගැනීම.
2. මිතුරාගේ ධනය ආරක්ෂා කර ගැනීම.
3. මිතුරා බියට පත් වූ විට පිහිට වීම.
4. මිතුරාට විපතක් සිදු වූ විට අත් නොහැරීම.
5. මිතුරාගේ නෑදෑයින් හට සංග්‍රහ කිරීම.

අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ මිත්ත සුත්‍රය යනු මිත්‍රත්වය පිළිබඳව වැදගත් වූ තවත් සුත්‍රයකි. එම සුත්‍රයේ සඳහන් පරිදි ඇසුරු කිරීමට සුදුසු මිත්‍රයා සතුව පැවතිය යුතු ලක්ෂණ හතකි[54]. එම ලක්ෂණ හත පහත පරිදි දක්වා ඇත.

1. දීමට අපහසු දේ දෙයි.
2. කරන්නට අපහසු දේ සිදු කරයි.
3. ඉවසිය නොහැකි දේ ඉවසයි.
4. මිතුරාට රහස් කියයි.
5. මිතුරාගේ රහස් සඟවා ගනී.
6. විපතේ දී මිතුරා අත් නොහරී.
7. ධන හානියෙන් අවමන් නොකරයි.

යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් තමන්ට මෙන්ම අනුන්ටද යහපත සළසයි. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම මගින් තමන්ට හිමි වන ප්‍රතිලාභ හෙවත් ආනිසංස පිළිබඳව මෙත්තානිසංස සුත්‍රයේ විස්තර කරයි. මෙත්තානිසංස සුත්‍රයේ විස්තර කරන සැබෑ මිත්‍රත්වයේ ආනිසංස පහත දක්වා ඇත.

- නිවසින් බැහැර තැනක වාසය කළද ආහාර පාන ආදීයෙහි හිඟතාවයක් ඇති නොවේ.
- බොහෝ දෙනෙකුගේ ඇසුර ලබයි.
- යම් ආගන්තුක රටකට නගරයකට හෝ ගමකට ගිය විට පිදුම් ලබයි.
- සොර සතුරන්ගෙන් කරදර නොවේ.
- පාලකයන් විසින් අවමන් නොකරයි.
- සතුරන් මැඩ පැවැත්වීමේ හැකියාව ලැබේ.
- ගැටුම් නිසා ඇතිවන සිත් තැවුල්වලින් තොරව ජීවිතය ගත කළ හැකිය.
- ගුණ ගරුක බව ගැන ප්‍රචලිත වේ.
- අනුන් හට උපකාර කර අනුනගෙන් උපකාර ලබයි.
- අනුන් හට ගරු කර අනුනගෙන් ගරුත්වය ලබයි.
- ලෝකයාගෙන් ප්‍රසංශා ලබයි.
- ගුණ පිළිබඳ වර්ණනා කරයි.

ISSN: 2012-7235

- මිත්‍රයන්ගෙන් පුද සත්කාර ලබයි.
- වැඳුම් පිදුම් ලබන්නෙක් වෙයි.
- කීර්තියට පත් වේ.
- යස ඉසුරු පරිවාර සම්පත් ලැබේ.
- සියළු සැප සම්පත් ලබයි.
- සත්ව පාලනය ආදී කර්මාන්තයන්ගෙන් ඵල ලබයි.
- කෘෂිකර්මාන්තය ආදීයෙන් ඵල දරයි.
- යහපත් දරු සම්පත් ලබයි.
- හදිසි අනතුරු වලින්අරක්ෂාව ලැබේ.
- සතුරු බධාවන්ගෙන් නොසැලී සිටී[55].

ඒ අනුව සළකා බලන කළ අන්තර් පුද්ගල සම්බන්ධතාවයන්ගේ වැදත්කම පිළිබඳව බොහෝ සෙයින් බෞද්ධ ඉගැන්වීම් හමු වේ. එමෙන්ම නූතන ව්‍යාපාර පරිසරය තුළ සංවිධාන බොහෝ සෙයින් හමු වන අතර පුද්ගලයන්ට ඒවාට සම්බන්ධ නොවී තම අවශ්‍යතා ඉටු කර ගත නොහැකි තරමටම සංවිධාන පොදු ලක්ෂණයක් වී ඇත. කෙතරම් ඉගැන්වීම් හමු වුවද පුද්ගලයන් සතුටින් කටයුතු කරන තත්වයක් දක ගත නොහැකිය. එම නිසා සංවිධාන කාර්යක්ෂමතාවය සහ සඵලත්වය අපේක්ෂිත මට්ටමින් ඉටුවන තත්ත්වයක් දක ගත් නොහැකිය. එයට බොහෝ සෙයින් හේතු සාධක වී ඇත්තේ සංවිධාන තුළ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා දක ගත නොහැකි වීමයි. බෞද්ධ ඉගැන්වීම් තුළ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවක් ඇති කර ගත හැකි සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සම්පූර්ණ මඟ පෙන්වීමක් ලබා දී ඇති බව කරුණු විමසීමේ දී තහවුරු වේ.

**8. සාරාංශය**

මිනිසා උපතේ සිට විවිධ වයස් මට්ටම්වලදී විවිධ සාමාජ පාර්ශවයන් සමඟ සම්බන්ධතා පවත්වයි. නූතන කළමනාකරණ ඉගැන්වීම් අධ්‍යයනය කිරීමේ දී අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ වැදත්කම පිළිබඳව කරුණු හමු වේ. ඒ අතරින් හෙන්රි මින්ස්බර්ග් දක්වන කළමනාකරණ භූමිකාවන් ඉටු කිරීම සඳහා අන්තර් පුද්ගල සම්බන්ධතාවන් වැදගත් වේ. එමෙන්ම අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ වැදගත්කම පිළිබඳව බොහෝ සෙයින් බෞද්ධ ඉගැන්වීම් හමු වේ. ඒ අතරින් අන්ගුත්තර නිකායේ අණන සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, දීඝ නිකායේ සිඟාලක සූත්‍රය, අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ මිත්ත සූත්‍රය සහ මෙත්තානිසංස සූත්‍රය එවැනි බෞද්ධ ඉගැන්වීම් කිහිපයකි. මෙම ඉගැන්වීම් තුළ හමු වන යහපත් ගති ලක්ෂණ නූතන සංවිධාන තුළ කටයුතු කරන පුද්ගලයන් තුළ ප්‍රගුණ කිරීම තුළින් කාර්යක්ෂමතාවය සහ සඵලත්වය තහවුරු කර ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1 වික්‍රමසිංහ, ජේ. ඩබ් 2002, ජනහිතකාමී ආර්ථික සංවර්ධනය; සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ බෞද්ධ න්‍යාය ගැන හැඳින්වීමක්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
2 කුමාර, එන්. වී. ජී. ඒ. එච් 2008, සමාජ විද්‍යාව මූලික සංකල්ප හා ක්‍රමවේදය, විජයසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල.
3 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.
4 චන්ද්‍රකුමාර, ඒ 2007, සංවිධාන චර්යාව, සි/ස දීපානී මුද්‍රණ සහ ප්‍රකාශණ සමාගම, ගංගොඩවිල, නුගේගොඩ.
5 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.
6 Cambridge university, Cambridge English Language Assessment, Research Notes, interpersonal relationship 2010, viewed 21 February 2016, http://www.cambridgeenglish.org/interpersonal+relationship
7 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.
8 Kottawatta, KHH 2008, Buddhist thoughts for appropriate labour management practices: from Sigalovada Suttha, Author, Homagama.
9 කළුආරච්චි, කේ. ඒ. එස්. පී 2012, සංවිධාන චර්යාව; න්‍යාය සංකල්ප සහ යෙදීම්, සි/ස ඇස්. ගොඩගේ සහ

ISSN: 2012-7235

සහෝදරයෝ (පුද්) සමාගම, කෝළඹ 10.

10 Champbell, A 1980, The sense of well-being in America: patterns and trends, Newyork, MC. Graw-Hill.

11 Stach, S1980, ‘The effect of marital dissolution on suicide’, Journal of Marriage and the Family, vol. 42, pp. 83-92.

12 Bloom, B.L, Asher, S.J& White, S.W 1978, 'Marital disruption as a stressor: a review and analyses, Psychological Bulletin, vol. 85 pp. 867-941.

13 Alexandrer, J.P 1973, Defensive and supportive communication in normal and deviant families, ‘Jounal of consulting and clinical psychology’, vol.40, pp.223-231.

14 Murstein, B.I 1972, ‘person perception and courtship progress among premarital couples’, Journal of marriage and the family, vol.34, pp. 621-627.

15 Adair, W.L, Talking It Through: Communication Sequences in Negotiation, University of Waterloo, Canada.

16 Quinn, F.M & Hughes, S.J 2007, "Quinn’s Principles and Practice of Nurse Education: Fifth Edition, Cheriton House, United Kingdom.

17 Adair, W.L, Talking It Through: Communication Sequences in Negotiation, University of Waterloo, Canada.

18 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

19 Kottawatta, KHH 2008, Buddhist thoughts for appropriate labour management practices: from Sigalovada Suttha, Author, Homagama.

20 www.mindtools.com/pages/article/newCDV_34.htmviewed 21 February 2016

21 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

22 www.mindtools.com/pages/article/newCDV_34.htmviewed 21 February 2016

23 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

24 www.mindtools.com/pages/article/viewed 22 February 2016

25 *Ibid.*

26 *Ibid.*

27 *Ibid.*

28 *Ibid.*

29 *Ibid.*

30 රාමනායක, ආර්. 2013, අලෙවි කළමනාකරණය, සි/ස සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

31 අත්තනායක, බි 2006, බුදුදහමේ පුද්ගල වර්ගීකරණය, සරස්වතී ප්‍රකාශකයෝ, දිවුලපිටිය.

32 කුමාර, එන්. වී. පී. ඒ. එච් 2008, සමාජ විද්‍යාව මූලික සංකල්ප හා ක්‍රමවේදය, විජයසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල.

33 උදයංග, එස් 2013, කළමනාකරණය සරලව, තරංජී ප්‍රින්ට්ස්, මහරගම.

34 වික්‍රමසිංහ, ජේ. ඩබ් 2002, ජනහිතකාමී ආර්ථික සංවර්ධනය, සි/ස එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

35 කුමාර, එන්. වී. පී. ඒ. එච් 2008, සමාජ විද්‍යාව මූලික සංකල්ප හා ක්‍රමවේදය, විජයසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල.

36 වික්‍රමසිංහ, ජේ. ඩබ් 2002, ජනහිතකාමී ආර්ථික සංවර්ධනය, සි/ස එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

37 එම

38 Kottawatta, KHH 2008, Buddhist thoughts for appropriate labour management practices: from Sigalovada Suttha, Author, Homagama.

39 Kottawatta, KHH 2008, Buddhist thoughts for appropriate labour management practices: from Sigalovada Suttha, Author, Homagama.

40 වික්‍රමසිංහ, ජේ.ඩබ් 2002, ජනහිතකාමී ආර්ථික සංවර්ධනය, සි/ස එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

41 Kottawatta, KHH 2008, Buddhist thoughts for appropriate labour management practices: from Sigalovada Suttha, Author, Homagama.

42 hhttp://dictionary.reference.com/browse/friendviewed 21 February 2016

43 අත්තනායක, බි 2006, බුදුදහමේ පුද්ගල වර්ගීකරණය, සරස්වතී ප්‍රකාශකයෝ, දිවුලපිටිය.

44 එම

45 එම

46 එම

47 එම

48 එම

49 විජේබණ්ඩාර, සී, මොරටුවගම, එච්. එම්., හේට්ටිආරච්චි, ඩී 2004, ,"උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය, පළමු කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ඉසුරුපාය.

50 එම

51 එම

52 එම

53 අත්තනායක, බි 2006, බුදුදහමේ පුද්ගල වර්ගීකරණය, සරස්වතී ප්‍රකාශකයෝ, දිවුලපිටිය.

54 එම

55 එම

ISSN: 2012-7235



චානක පියසේන